## 203 කාලය එනතුරු

කාලය එනතුරු ඉවසන්න
කෙතේ තිරිඟු රැකගන්න
එකට වැඩෙන්නට එකම බිමේ
කිරිඳි වලට ඉඩ දෙන්න

කිරිඳි තිරිඟු පැල එක යායේ
වැඩුනත් කුමටද බිය වනුයේ
මෝරා අස්වනු නෙළන පැයේ
කිරිඳි කපා වෙන්කල හැකි වේ

සුදන දුදන මිනිසුන් මෙලොවේ
එක්ව සිටියදෙන් මහ පොළොවේ
පින පව තුලනය වන දවසේ
තීරණ දෙව් විනිසුරු සතුවේ

දමිටු අදමිටුන් අප අතරේ
හඳුනා ගැනුමටද පහසු නොවේ
සගුණ නුගුණ දෙක මුසුව තියේ
මිනිසුන් තුළ මේ දෙරණ පිටේ

මිනිසුන් යහගුණ අගේ කරව්
නුගුණ කියා නින්දා නොකරව්
එවන් වැරදි දැක කමා කරව්
පසිඳලීම දෙවිඳුට පවරව්